www.PapaCambridge.com

UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2011**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

DC (LEO/SW) 38506/3
© UCLES 2011

UNIVERSITY *of* CAMBRIDGE International Examinations

**BLANK PAGE**

www.PapaCambridge.com

www.PapaCambridge.com

## Section A – Translation

**1** Translate into **English**.

නවීන්ගේ මිතුරන්ගෙන් වැඩිදෙනෙක් පාසලට පයින් යද්දී නවීන් දිනපතා පාපැදියෙන් ගියේය. නවීන් සහ ඔහුගේ හොඳම මිතුරා වූ රවී යන දෙදෙනාටම ඔවුන්ගේ එකොළොස්වන උපන් දිනයේ පාපැදි දෙකක් තෑගි වශයෙන් ලැබී තිබුණි. දින කීපයකට පසු දෙදෙනාම පාපැදිවලින් පාසල් යාමට පටන් ගත්හ. පාරේ තරමක කන්දක් නැගීමට තිබූ කොටසට නවීන් වැඩි කැමැත්තක් දැක්වූයේ කන්ද මුදුනේ සිට අනිත් පැත්තට වු පල්ලමේ කකුල් ඔසවාගෙන වේගයෙන් යන්නට හැකි වු බැවිනි. කන්ද පා මුලට ළඟාවන ඔහු රවී එනතුරු බලා සිටී . එතැන සිට දෙදෙනා එකට සයිකල් පැදගෙන යති. ගමනේ අවසාන විනාඩි දහය තුළ ඔවුන්ට නිතර පාසල් මිතුරන් පසුකර යාමට සිදුවේ. තමන්ගේ බර පාසල් බෑග් හැන්ඩ්ල්වල එල්ලාගෙන යා හැකිදැයි මිතුරෝ නිතරම ඔවුන්ගෙන් අසති. ඒත් නවීන් සහ රවී සිනාසෙමින් ඔවුන් පසුකර යති. දවසේ ඉතිරි කාලයේ කුමක් සිදුවුවත් පාසලට පාපැදියෙන් යාම සහ ඒම නිසා හැම දවසක්ම සිනාවකින් අරඹන්නට ඔවුන්ට පුලුවන් විය.

[10]

**2** Translate into **Sinhala**.

Mahesh was feeling nervous before his long flight and he had not been able to sleep for the last three nights. He woke early on the day of his flight, knowing that there was still an hour before he had to leave for the airport. He still had a few things to pack, and had to find a lock for the suitcase.

After breakfast, he packed his toothbrush and comb and closed the suitcase. Suddenly, he remembered that he had not packed his coat. The suitcase was getting very full, and he wondered how his big coat was going to fit inside.

Mahesh did his best to close the suitcase, and even sat on it. Then he heard a strange cracking sound and he saw that he had broken it. He panicked as he did not have another suitcase. He knew that the shops would not be open at this time in the morning, so he ran to his neighbour's house and knocked on the door, but there was no answer.

Desperately, he phoned his friend Sanjeewa, and luckily he did have a spare suitcase. Mahesh jumped into his car and drove the twenty minute journey to his friend's house, picked up the suitcase and returned home. He emptied all of his items into the new case, locked it, threw it into the boot of his car and rushed to the airport to catch his plane.

Unfortunately, the flight was cancelled due to bad weather.

[20]

www.PapaCambridge.com

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer the questions in **Sinhala**.

පෙර පාසල් පන්තියේ දරුවෝ එදින මහත් සිත් කැළඹිල්ලකින් සිටියහ. ඔව්හු තම දෙමාපිය සොයුරු සොයුරියන් ඉදිරියේ තමන්ගේ පළමු නාට්‍යය රඟ දැක්වීමට සූදානම් වෙමින් සිටියහ. එය සත්තුවත්තේ සිටින සියලුම සතුන් පිළිබඳ නාට්‍යයකි. තමන් අතර දක්ෂතමයා තෝරාගැනීම සඳහා සත්තු තරඟ කරති. පන්තියේ ළමයි තිස් දෙනාම නාට්‍යයට සහභාගි වෙති. සමහරුන්ට කථාකරන කොටස් කිරීමට තිබුණ අතර අනිත් අයට තමන් නිරූපණය කරන සතුන් මෙන් රඟපාන්නට හෝ නටන්නට සිදුවිය. ගුරුතුමිය හා ඇගේ සහායිකාවන් මුලු උදේවරුවම ගත කළේ ඇඳුම් පැළඳුම් තෝරමින් ඒවා වෙන වෙනම පෙට්ටිවලට දමා ඒ ඒ දරුවාගේ නම ඒවායේ ලිවීම සඳහාය. පසුගිය සතිය පුරාම දරුවන් කාලය ගත කළේ සත්ව වෙස් මුහුණු සෑදීමට හා සිංහ, කොටි. වඳුරු හා පීරාඟ් වැනි සත්ව රූප පාට කිරීමටය.

රැඟුම සඳහා ඇඳීමට කලු කලිසම් හා ටී ෂර්ට් ගෙනෙන ලෙස ගුරුතුමිය දැනුම් දි තිබුණි. හැම දරුවාටම මෙන් එය මතක තිබුණත් ඇය වැඩිපුර ඇඳුම් කට්ටල කීපයක් සූදානම් කර තැබුවාය. කෙසේ වෙතත් නාට්‍යය ආරම්භ වීමට වේලාව ළංවත්ම ගුරුතුමියගේ ද සිත තරමක් කලබල විය. දිවා ආහාරය ඉක්මණින් නිමවා ක්‍රීඩා පිටියට ගොස් වෙනදාට වඩා කලින් ආපසු එන ලෙස ඇය දරුවන්ට කීවේ ඇඳුම් මාරුකරගෙන වෙස්මුහුණු පැළඳ ගන්නට ඔවුන්ට අවශ්‍ය තරම් කාලය ලබා දෙන්නටය. එහෙත් පිරිමි දරුවන් තිදෙනෙකුට එය අමතක වී තිබුණි. තවමත් එළියේ පාපන්දු ගසමින් සිටි ඒ ළමා නළුවන් තිදෙනා කැඳවාගෙන එන්නට ඇයට සිදුවිය.

ඇය ආපසු ඔවුන් කැටුව එද්දී දැරියන් දෙදෙනෙක් තමන්ගේ වෙස්මුහුණ කුමක්දැයි වාදයක පැටලී සිටි අතර සමහරුන්ගේ කලිසම් ද මාරුවී තිබුණි. එක් දරුවෙක් තමාට වඩා දෙගුණයක් ලොකු කලිසමක් ඇඳගන්නට තැත්කරමින් සිටයේය. එම දරුවා සඳහා ඔහුට ගැළපෙන කලිසමක් සොයා දෙන්නට එක් කාන්තාවක් මහත් කලබලයකින් උත්සාහ කරමින් සිටියාය. පිටත සිට කැටුව ආ දරුවන් තිදෙනාට දොස් කී ගුරුතුමිය ඉක්මණින් ඇඳුම් මාරුකරගන්නා ලෙසත් හොඳින් හැසිරෙන ලෙසත් ඔවුන්ට නියම කළාය. මේ වනවිට කුඩා ශාලාව තුළ දෙමාපියෝ හා නෑදෑයෝ අසුන් ගනිමින් සිටියහ.

ඇඳ පැළඳගෙන සැරසුණු දරුවන්ට එකිනෙකා පිටුපසින් දොර අසළ පේළියක් සෑදි වේදිකාවට ගමන් කරන්නට සූදානම්ව සිටින ලෙසත් ගුරු තුමිය කිවාය. තිරය පිටුපස සිටගෙන වේදිකාවට ගමන් කරන්නට නියම කළ ඈ නිහඬව යාඥාවක් ද කළාය. වේදිකාවට නගිද්දි එක් දරුවකු අත වූ කොළ කැබැල්ල බිම වැටුණ අතර පිටුපසින් ආ දරුවා ඇගේ හැපුණි.

මෙවැනි සුලු බාධා තිබුණ ද පන්තියේ දරුවෝ වෙනත් ගැටලුවකින් තොරව නාට්‍යය ඉදිරිපත් කළහ. තමන්ට නියමිත පෙළ, නැටුම් හා රංගනයන් සියලු දෙනාටම හොඳින් මතක තිබුණි. අවසානයේ දරුවන් සමඟ ආචාර කිරීමට ගුරුතුමිය වේදිකාවට පැමිණෙද්දී ප්‍රේක්ෂකයෝ අසුන්වලින් නැඟිට අත්පොළසන් දුන්හ. කෙසේ වෙතත් නාට්‍යය හොඳින් අවසන්වීම ගැන ගුරුතුමිය සතුටු වූවාය.

www.PapaCambridge.com

Now answer the following questions in **Sinhala** using your own words as far as possible.

**3** පෙර පාසල් පන්තිය පෙන්වන්නට සූදානම් වූ නාට්‍යය කුමක් ද?

**4** නාට්‍යයට සූදානම් වීම සඳහා දරුවන් නිරත වූ කටයුතු මොනවාද? [

**5** නාට්‍යය සඳහා දරුවන් ඇඳිය යුතු වූයේ මොනවාද? [2]

**6** දරුවන්ට වෙනදාට වඩා අඩුකාලයක් සෙල්ලම්පිටියේ ගතකරන්නට සිදුවූයේ මන්ද? [1]

**7** දරුවන්ගේ නාට්‍යයට පෙර යමක් වරදින්නට යන බව ඇඟ වූ සිදුවීම් කවරේ ද? [3]

**8** ගුරුතුමිය නිහඬ යාඥාවක් කරන්නට ඇතැයි ඔබ සිතන්නේ ඇයි? [2]

**9** මේ ඡේදයේ ඇති කවර සිදුවීම්වලින් ගුරුතුමිය සිය කාර්යය හොඳින් කළ බව ඇඟවේද? [3]

**10** වේදිකාව මතට යාමට පෙර දරුවන් හැසිරිය යුතු වූයේ කෙසේ ද? [2]

**11** නාට්‍යයට ලැබුණ ප්‍රේක්ෂක ප්‍රතිචාරය කෙබඳු ද? [1]

**12** නාට්‍යය අවසන් වීම ගැන ගුරුතුමිය සතුටු වූයේ මන්දැයි ඔබ සිතන්නෙහි ද? [3]

Language and spelling [5]

**Total marks [25]**

BLANK PAGE

www.PapaCambridge.com

**BLANK PAGE**

www.PapaCambridge.com

**BLANK PAGE**

www.PapaCambridge.com

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of